# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,956 - 2016 පෙබරවාරි මස 26 වැනි සිකුරාදා - 2016.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 640 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 641 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මාර්තු මස 18 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මාර්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු – ඇබෑර්තු

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලේකම්, ප්‍රාදේශීය සභාව, දික්වැල්ල යන ලිපිනයට 2016.03.10 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | බර උපකරණ ක්‍රියාකරු | 01 | PL 3 2006A රු.12,470-10x130-10x145-10x160-12x170-රු.18,860 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් 06ක් සමත් වී තිබීම. |

03. *වෙනත් සුදුසුකම් :*

ජාතික වෘත්තීය කුසලතා NVQ හතර (4) වැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක්/ප්‍රවීනතා සහතිකයක් මගින් තහවුරු කෙරෙන කාර්මික/ශිල්පි/වෘත්තීය කුසලතාවන් අවශ්‍යවන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු අතර, මෝටර් රථ රියදුරන් රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය.

04. *වයස :*

අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි අය විය යුතු ය.

05. *වෙනත් :*

අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 05ක අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්පත් කැඳවීමෙන් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගැනේ.

ලේකම්,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*දික්වැල්ල ප්‍රාදේශීය සභාව*

*බර උපකරණ ක්‍රියාකරු තනතුර*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

01. මුලකුරු සමඟ නම :——————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
04. ස්ථිර පදිංචි ලිපිනය :——————————.
05. තැපැල් ලිපිනය :——————————.
06. ජාතිය :——————————.
07. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
08. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.
09. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :——————————.
10. උපන් දිනය :——————————.
11. 2015.12.31 වැනි දිනට වයස :——————————.
12. අධ්‍යාපන සුදුසුකම් :——————————.
13. පළපුරුද්ද :——————————.
14. වෘත්තීය සුදුසුකම් :——————————.
15. වෙනත් සුදුසුකම් :——————————.
16. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේ ද ? :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට හා බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව හොඳාකාරවම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

02-706

---

# පළාත් පාලන නිවේදන

## පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

### තහනමට ගත් දේපළ ප්‍රසිද්ධියේ විකිණීම

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවට අයත් වීරඹුගෙදර උප කාර්යාල බල ප්‍රදේශයේ වරිපනම් බදු නොගෙවීම හේතු කොටගෙන තහනමට ගනු ලැබූ පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2016.02.29 වැනි දින වීරඹුගෙදර ප්‍රාදේශීය සභා උපකාර්යාල භූමියේ දී පෙ.ව. 10.30ට ප්‍රසිද්ධියේ විකුණන බව මෙයින් නිවේදනය කරමි.

1. ආසන තුනේ සෙට් පුටු 1

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
පොල්ගහවෙල.

02-800

---

## අලව්ව ප්‍රාදේශීය සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් පී. ඒ. පී. මල්ලිකා වන මම නිවාස හා දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 2016.02.10 දිනැති තීරණ අංක 13 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

පී. ඒ. පී. මල්ලිකා,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
අලව්ව ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2003.11.28 වැනි දින අංක 1317 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ පළකරනු ලැබුවා වූ වයඹ පළාතේ නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා එකී *ගැසට් නිවේදනය* පරිච්ඡින්න කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) *ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ 2014.10.01 වැනි දින හා 1882/22 අංකයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දවූ ද, නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා එකී *ගැසට් නිවේදනයට* සංශෝධන වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) *ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ 2015.01.20 වැනි දින හා 1898/28 අංකයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දවූ ද, නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදළ සංශෝධන හා 2014.10.01 දිනැති අංක 1882/22 දරන (අතිවිශෙෂ) *ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ පලවූ නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කරමින් ප්‍රකාශයට පත් කරන ලද්දවූ ද 2015.08.28 දින හා 1929/45 අංකයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දවූ ද නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදළ සංශෝධන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 හා 126 වන වගන්ති ප්‍රකාරව මම තීරණය කරමි.

02-736

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. චන්ද්‍රාවතී,<br>ලේකම්,<br>ප්‍රාදේශීය සභාව,<br>අරණායක.

2016 පෙබරවාරි මස 05 වැනි දින,<br>අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*මාර්ගයේ නම* :- හබලක්කාව බදුවත්ත මාර්ගය<br>*මාර්ගයේ ආරම්භය සහ අවසානය*:- හබලක්කාව සිට තල්ගස්පිටිය දක්වා මාර්ගයේ සිට කුරගල හන්දිය දක්වා මාර්ගය<br>*ග්‍රාමසේවා වසම හා අංකය* :- 44 ඒ, හබලක්කාව වසම<br>*මාර්ගයේ දිග හා පළල* :- දිග මීටර් 182, පළල අඩි 08

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

| | | | |
|---|---|---|---|
| 1. | ඒ. ජී. තිලකාවතී මිය | - | ගෙපලේගෙදරවත්ත ඉඩම |
| 2. | ඒ. ඩී. ප්‍රේමරත්න මයා | - | ගෙපලේගෙදරවත්ත ඉඩම |
| 3. | ඒ. ඩී. ගුණරත්න මයා | - | ගෙපලේගෙදරවත්ත ඉඩම |
| 4. | ඒ. ඩී. සයිමන් මයා | - | බදුවත්ත ඉඩම |
| 5. | ඒ. ඩී. අජිල් රොබට් මයා | - | බදුවත්ත ඉඩම |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

| | | | |
|---|---|---|---|
| 1. | ඒ. ඩී. ජී. පියල් කුමාරසිරි මයා | - | ගෙපලේගෙදරවත්ත ඉඩම |
| 2. | ඒ. ඩී. ප්‍රේමරත්න මයා | - | ගෙපලේගෙදරවත්ත ඉඩම |
| 3. | ඒ. ඩී. ගුණරත්න මයා | - | ගෙපලේගෙදරවත්ත ඉඩම |
| 4. | ඒ. ඩී. අජිල් රොබට් මයා | - | බදුවත්ත ඉඩම |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2015.10.22 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 320/2015 දරන පිඹුරුපත අනුව වේ.


එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.
ලියාපදිංචි අංකය: 19831492

පිඹුරු අංකය: 320/2015

# හබලක්කාව බදුවත්ත මාර්ගය

යොමුව :- අරණායක ප්‍රාදේශීය සභා සභාපතිගේ අංක
අර/ප්‍රාස/07/මාර්ග මැනුම් හා 2006.10.04 දින ලිපිය

පරිමාණය 1:1000




## සබරගමුව පළාතේ

## කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බඩ කෝරළේ තුන්පළාත පත්තුවේ හබලක්කාව ගමේ පිහිටි
ගෙපලෙගෙදරවත්ත සහ බටුවත්ත
යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සදන ලද

## -පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0465 | 0 | 0 | 18.38 | 182.00 | 08 | |

2015-10-25

මනින ලද්දේ : 2015.10.22 වන දින

එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
: 035-2266422/077 4975810

*මාර්ගයේ නම* :- ගල්අතර අස්මඩල කෙත්සිසිල මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය*:- ගල්අතර අස්මඩල රණබාහුගේ වත්තේ සිට අයි. ඩබ්. විමලසේන මයාගේ නිවස දක්වා වන මාර්ගය

*ග්‍රාමසේවා වසම හා අංකය* :- 16ඩී අස්මඩල

*මාර්ගයේ දිග හා පළල* :- දිග මීටර් 154, පළල අඩි 08


මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. අයි. ඒ. සලෙලු මයා - රණබාහුගේවත්ත ඉඩම
2. එල්. පී. සරත්චන්ද්‍ර මයා - හිටිනාවත්ත ඉඩම
3. එස්. ඩබ්. ජී. ආරියදස මයා - ගෙදරගාවදෙනිය ඉඩම
4. අයි. ඩබ්. ශාන්ත සූරිය කුමාර මයා- හිටිනාවත්ත ඉඩම
5. ටී. වී. නිහාල් චන්ද්‍රසිරි මයා - හිටිනාවත්ත ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. අයි. ඒ. සලෙලු මයා - රණබාහුගේවත්ත ඉඩම
2. එල්. පී. සරත්චන්ද්‍ර මයා - හිටිනාවත්ත ඉඩම
3. එස්. ඩබ්. ජී. ආරියදස මයා - ගෙදරගාවදෙනිය ඉඩම
4. අයි. ඩබ්. ටී. වී. අශෝක මයා - හිටිනාවත්ත ඉඩම
5. අයි. ඩබ්. විමලසේන මයා - හිටිනාවත්ත ඉඩම

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2015.11.22 දින මනින ලද පිඹුරුපත් අංක 352/2015 දරන පිඹුරු පත අනුව වේ.




| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0240 | 00 | 0 | 09.49 | 154.00 | 08 | ——— |

*මාර්ගයේ නම* :- කාරියගම කොන්ඩගන්දෙනිය මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය*:- කාරියගම කොලොම්බියාවත්ත ඉඩමේ සිට කොන්ඩගන්දෙනිය ඉඩම දක්වා මාර්ගය

*ග්‍රාමසේවා වසම හා අංකය* :- 17ඒ කාරියගම

*මාර්ගයේ දිග හා පළල* :- දිග - මීටර් 376, පළල - අඩි 10


මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. එම්. පඤ්ඤානන්ද හිමි - කොලොම්බියාවත්ත ඉඩම
2. ඩබ්. ආර්. දීපා ජයන්ති මැණිකේ මිය - කොන්ඩගන්දෙනිය ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. එම්. පඤ්ඤානන්ද හිමි - කොලොම්බියාවත්ත ඉඩම
2. ඩබ්. ආර්. දීපා ජයන්ති මැණිකේ මිය - කොන්ඩගන්දෙනිය ඉඩම

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2015.10.17 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 319/2015 දරන පිඹුරුපත අනුව වේ.



මාර්ගයේ නම :- කාරියගම වලව්වත්ත පටුමග

මාර්ගයේ ආරම්භය සහ අවසානයඃ- කාරියගම අරණායක ප්‍රධාන මාර්ගයෙන් විහිදෙන වලව්වත්ත පටුමග දංගහමුලහේන ඉඩමෙන් ආරම්භව අරඹේහේන ඉඩමෙන් අවසන් වන මාර්ගය

ග්‍රාමසේවා වසම හා අංකය :- 17ඒ කාරියගම

මාර්ගයේ දිග හා පළල :- දිග - මීටර් 140, පළල - අඩි 10


මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම ඃ

1. පී. ජී. සරත් ප්‍රියන්ත මයා - දංගහමුලහේන ඉඩම
2. ඒ. ජී. නාලනී කුලසිංහ මිය - දංගහමුලහේන ඉඩම
3. කේ. ජී. වසන්ත බණ්ඩාර මයා - දංගහමුලහේන ඉඩම
4. ජී. ඩබ්. නිල්මිණි චාන්දනී - හපුගහමුලහේන ඉඩම
5. එම්. ඒ. අයි. රූපකුමාරි මිය - හපුගහමුලහේන ඉඩම
6. ඩී. දයාරත්න මයා - හපුගහමුලහේන ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම ඃ

1. ඩී. අනුලාවතී මිය - වලව්වත්ත ඉඩම
2. එච්. ජේම්ස් මයා - වලව්වත්ත ඉඩම

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2015.11.25 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 356/2015 දරන පිඹුරුපත අනුව වේ.




| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර) | පළල(අඩි) |
|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර | අ | රූ | පර් | | |
| 1 | 0.0436 | 0 | 0 | 17.24 | 140.00 | 10 |

මාර්ගයේ නම :- අට්ටාපිටිය වැලිහේන ආරාම මාර්ගය

මාර්ගයේ ආරම්භය සහ අවසානයඃ- අළුපත සිට තල්ගමුව මාර්ගයේ අට්ටාපිටිය කමත අසල සිට වැලිහේන ආරාමය දක්වා මාර්ගය

ග්‍රාමසේවා වසම හා අංකය :- 33ඒ අට්ටාපිටිය

මාර්ගයේ දිග හා පළල :- දිග - මීටර් 230, පළල - අඩි 08


මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. ඒ. එම්. පුංචිබණ්ඩා මයා - වාගොල්ලවත්ත ඉඩම
2. ඒ. එම්. පුංචිබණ්ඩා මයා - අඹකුඹුර ඉඩම
3. තිලක් එස්. කරුණාතිලක මයා - අඹකුඹුර ඉඩම
4. එස්. ජී. එල්. විජේරත්න බණ්ඩා මයා - උඩදෙනියවත්ත ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. ඒ. එම්. පුංචිබණ්ඩා මයා - අඹකුඹුර ඉඩම
2. එම්. කුඩාබණ්ඩා මයා - එගොඩවාගොල්ලවත්ත ඉඩම
3. එල්. වී. ආර්. පොඩිබණ්ඩා මයා - වැලිහේන ඉඩම
4. ජී. ආර්. ගුණවර්ධන බණ්ඩා මයා - වැලිහේන ඉඩම

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2015.11.25 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 354/2015 දරන පිඹුරුපත අනුව වේ.



*මාර්ගයේ නම* :- අරණායක දෙවට මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය*:- අරණායක මාවනැල්ල මාර්ගයේ සිට යූ. ඩබ්. චන්ද්‍රාවතී මියගේ නිවස දක්වා මාර්ගය

*ග්‍රාමසේවා වසම හා අංකය* :- 43 අරණායක

*මාර්ගයේ දිග හා පළල* :- දිග - මීටර් 129, පළල - අඩි 08


මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. ඒ. එස්. මාරසිංහ මයා - පන්සලේවත්ත ජම්බුගහවත්ත ඉඩම
2. යූ. ඩබ්. පියතුංග මයා - පන්සලේවත්ත ජම්බුගහවත්ත ඉඩම
3. යූ. ඩබ්. පේමචන්ද්‍ර ගුණදස මයා - ගෙදරගාවවත්ත ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. බී. ජී. ආරියරත්න මයා - දෙවටගහමූල ඉඩම
2. ජී. බී. ගාමිණී උඩබේසේකර මයා - දෙවටගහමූල ඉඩම
3. යූ. ඩබ්. චන්ද්‍රාවතී මිය - ගෙදරගාවවත්ත ඉඩම

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2015.11.25 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 357/2015 දරන පිඹුරුපත අනුව වේ.



*මාර්ගයේ නම* :- අස්මඩල ගල්ගොඩහේන සිට හපුගොල්ලහේන දක්වා මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය*:- අස්මඩල ගල්ගොඩහේන ඉඩමේ සිට හපුගොල්ලහේන ඉඩම දක්වා ඇති මාර්ගය

*ග්‍රාමසේවා වසම හා අංකය* :- 16ඩී අස්මඩල

*මාර්ගයේ දිග හා පළල* :- දිග - මීටර් 253, පළල - අඩි 08


මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. කේ. රණසිංහ මයා - ගල්ගොඩහේන ඉඩම
2. ඊ. ඒ. සරත් ඒකනායක මයා - මැලේබැදිතැන්න ඉඩම
3. කේ. පී. කපිල මයා - ගල්ලෙනමුලහේන ඉඩම
4. ලලිත් කන්දපහල මයා - ගල්ලෙනමුලහේන ඉඩම
5. පී. ආර්. හීංමැණිකේ මිය - හපුගොල්ලහේන ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. කේ. රණසිංහ මයා - ගල්ගොඩහේන ඉඩම
2. අයි. ආර්. ඒ. බිසෝමැණිකේ මිය - මැලේබැදිතැන්න ඉඩම
3. අයි. ආර්. ඉන්ද්‍රානි රණබාහු මිය - මැලේබැදිතැන්න ඉඩම
4. ඊ. ඒ. සරත් ඒකනායක මයා - මැලේබැදිතැන්න ඉඩම
5. ඊ. ඒ. සරත් ඒකනායක මයා - ගල්ලෙනමුලහේන ඉඩම
6. පී. ආර්. පොඩිබණ්ඩා මයා - හපුගොල්ලහේන ඉඩම

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2015.11.22 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 351/2015 දරන පිඹුරුපත අනුව වේ.




02-738

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.